**ශීර්ෂය 431 පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේදී ස්ථාපිත වී ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.6.1** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-----------------------------

**(අ)** **ආදායම් නොවන ලැබීම්**

-------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව වෙනත් ලැබීම් එකතුව රු.109,202 ක් වුවද, 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ කිසිදු වටිනාකමක් සඳහන් කර නොතිබුණි. එම නිසා ලැබීම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | අවසන් ගිණුම සකස් කිරීමේදී එම ආදායම් ලැබීම් අවසන් ගිණුමට ඇතුළත් කිරීම අතපසු වී ඇත. නමුත් 2020 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය වෙත රු.109,202 ක් ආදායම් ලැබීම් තිබූ බවට පිළිගනිමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| **(ii)** | භාණ්ඩාගාර මුද්‍රිත (එස්.ඒ 52) අනුව වර්ෂය තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් ශේෂය රු.358,339 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.87,960 ක් ලෙස රු.270,379 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂය තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් ශේෂය රු:358,339 ක් බව නිවැරදි වෙයි. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අත්තිකාරම් ලැබීම් සම්පූර්ණ මුදල වන රු.358,339 මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ලැබීම් යටතේ සටහන් විය යුතු බව පිළිගනිමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය නිවරැදිව සකස් කළ යුතු වේ. |

(ආ) **මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.1,773,130 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 6) මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.1,564,299 ක් ලෙස රු.208,831 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ (ඒසීඒ 6) හි මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.1,564,299 ක් ලෙස සටහන් කිරිම රු.1,773,130 ක් ලෙස නිවැරදි විය යුතු බව පිළිගනිමි. | මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම නිවැරදිව හඳුනාගැනීම සිදුකළ යුතු වේ. |

(ඇ) **අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,044,081,783 ක් විය යුතු වුවද එම ශේෂය සදොස් ලෙස රු.2,039,800,555 ක් ලෙස රු.4,281,228 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් ලැබීම් ශේෂය රු.109,202 ක මුදලද රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ලැබීම් ශේෂය රු.87,960 වෙනුවට රු.358,339 මුදලද, රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගෙවීම් ශේෂය රු.706,673 ක් වෙනුවට රු.5,367,507 ක් මුදලද, ඇතුළත් කළ විට ශේෂය රු.2,044,081,783 ලෙස නිවැරදිවිය යුතු බව බවට එකඟ වෙමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වේ. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

### (අ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 4) 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,275 ක් ලෙස සටහන් කර තිබුණද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ, තැන්පතු ගිණුම් ශේෂයක් නොතිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ශේෂය රු.1,275 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඒසීඒ - 4 හි 2020/12/31 දිනට ශේෂය රු.1,275 ලෙස සඳහන්ව තිබීම නිවැරැදි වෙයි. නමුත් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ තැන්පතු ගිණුමේ ශේෂය ලෙස රු.1,275 සඳහන් කිරීම අතපසු විමෙන් ඇතුළත් වී නොමැත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වේ. |

### (ආ) දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් වියදම් සාරාංශය (SA 10) අනුව මූලධන වත්කම් අත්පත්කර ගැනීමේ වටිනාකම රු.1,773,130 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම ලෙස රු.1,564,299 ක් ලෙස රු.208,831 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.1,564,299 ලෙස දැක්වුව ද එය රු.1,773.130 ක් ලෙස සටහන් කළ යුතු බවට එකඟ වෙමි. | මූලධන වත්කම් ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැන්පත් තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් මුදල් අයකිරිම ආරම්භ කර ඇප තැන්පත් ලේඛනය පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස නිලධාරින් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි 891(i) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 288 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.මිලියන 261 ක් පමණක් උපයෝජනය කර රු.මිලියන 27 ක් ඉතිරි කර තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු තාත්ත්විකව පිළියෙල කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන වේ. අමාත්‍යාංශය ආරම්භක අවධිය බැවින් අනුමත කාර්ය මණ්ඩලය 2020 දෙසැම්බර් මාසය වන විට සම්පූර්ණ වී නොතිබිණි. එබැවින් මෙහෙයුම් වියදම් අඩුවී ඇත. | තාත්ත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 193 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 128 ක් උපයෝජනය කර රු.මිලියන 65 ක් ඉතිරි කර තිබුණි. ඒ අනුව සියයට 34 ක් ඌන උපයෝජනය වී තිබුණි. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි, වාහන වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් දැරීම සිදුනොවුණි. එමෙන්ම 2020 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 රෝගී තත්වය හේතුවෙන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවූ බැවින් එම වැය විෂයන්වල වියදම අඩුවී ඇත. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු වියදම් ප්‍රකාශයේ (ඒසීඒ- 2 ii) මුළු වියදම තීරුවේ දක්වා තිබුණු වැය විෂයයන් 10 ක සහ වැය ලේජරයේ ඇතුළත් එම වැය විෂයයන්වල වටිනාකම් අතර රු. 923,643 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය. | 2020 නොවැම්බර් මාසය දක්වා මෙම අමාත්‍යාංශයට අදාළ වියදම් ගිණුම්ගත කරන ලද්දේ වැවිලි අමාත්‍යාංශය විසිනි. වැය ලෙජරය පවත්වා ගෙන යන ලද්දේ එම අමාත්‍යාංශය විසිනි. මෙම අමාත්‍යාංශයට අදාළ වියදම් සඳහා ප්‍රතිපාදන වැවිලි අමාත්‍යාංශය විසින් පවරාගෙන ගිණුම් ගත කර තිබුණි. ඇතැම් වැය විෂයන් යටතේ වැය ලෙජරයේ සඳහන් කරන ලද මුදල හා එම අමාත්‍යාංශය විසින් ගිණුම් ගත කරන ලද මුදල අතර වෙනස්කම් තිබුණි. 2020 වර්ෂයේ වැය ලෙජරය ක්‍රමානුකූලව සටහන් නොවුණ ද මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සඳහා භාණ්ඩාගාරයට වාර්තා කළ නිවැරදි වියදම් විස්තර අදාල කර ගත් බව සඳහන් කරමි. | වෙනස්කම් ඇති නොවනසේ වැය ලෙජරය නිසි අයුරින් පවත්වා ගත යුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**රජයේ නිලධාරින්ගේ ඇප තැබීම**

**------------------------------------**

| **විගණන නිරීක්ෂණය**<br>------------------------ | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>----------------------------------------- | **නිර්දේශය**<br>------------- |
|---|---|---|
| අමාත්‍යාංශයේ මු. රෙ. 880 (i) යටතේ පරිපාලන නිලධාරී, මුදල් අයකැමි,ගබඩා නිලධාරී, රියදුරු යන තනතුරු දරන 5 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගෙන නොතිබුණි. | අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් අය කර ඇප තැන්පත් ලේඛනය පවත්වා ගෙන යාමට අදාළ කටයුතු කඩිනමින් සිදු කරන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය**<br>------------------------ | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------------------------------- | **නිර්දේශය**<br>------------ |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 66 ක් වූ අතර, එයින් 38 ක් පුරප්පාඩුව පැවතුණි. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් 2020/12/31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතිණි. ඉතා කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. | අතවශ්‍යාම පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වීම. |